# බුදු දහමේ ආගමික ලක්ෂණ පිළිබඳ විමසුමක්

**- ආචාර්ය පූජ්‍ය හෝමාගම ධම්මානන්ද හිමි**

මානවයා සමාජ ගත සත්වයකු බවට පත් වූයේ, මීට වසර දස ලක්ෂ ගණනකට පෙරය. ලෝක සත්ත්වයන් අතර සිතීමේ හා විමසීමේ හැකියාව ඇති එකම සත්ත්වයා වන මිනිසා ස්වභාව ධර්මයේ අපූරු නිර්මාණයකි. (මිනිසාගේ ආර්ම්භය හෙවත් සම්භවය පිළිබඳ ලෝකයේ පිළිගත්, සම්මත, ප්‍රධාන මත දෙකක් තිබේ. ඉන් එකක් පරිනාම වාදයයි. අනෙක නිර්මාණවාදයයි. පරිනාම වාදය අනුව මානවයා වානර කුලයෙන් පරිනාමය වූ සත්වයෙකි. නිර්මාණවාදයට අනුව කිසියම් සර්වබල ධාරී දෙවියෙකු මිනිසාගේ නිර්මාතෘ ලෙස සැලකේ.) මිනිසා හැම කල්හි ම ජීවත් වූයේ කණ්ඩායම් වශයෙනි. හුදකලා ජීවිතය ප්‍රිය නොකළ ඔහු සාමුහිකව ජීවත් වීමේදී විවිධ යුග, අවධි පසු කළේය. පාසාන යුගය, එඬේර යුගය, කෘෂික යුගය, කාර්මික යුගය ආදී වශයෙනි. මේ බව පෙර අපර දිග පෞරාණික සංස්කෘතීන් අධ්‍යයනය කිරීමේදී මනාව සනාථ වේ.

මේ සා දීර්ඝ ගමනේදී මිනිසා විවිධ වූ තාඩන පීඩනයන්ට සහ දුක් ගැහැටවලට භාජනය විය. දහසකුත් එකක් මේ අභියෝග ඔස්සේ ඔහු විවිධ වූ ජීවිත අද්දැකීම් ලද්දේය. මිනිසා හමුවේ පැනනැගි ගැටළු අප්‍රමාණ විය. සමහර දේ ඔහු සාර්ථකව විසඳා ගත්තේය. තවත් සමහර දේ කාලයට ඉඩදී විසඳෙන තුරු බලා සිටියේය. සමහර දේ කෙරෙහි ඔහු විශ්මයෙන් මෙන් බලා



සිටියේ ඒවා විසඳා ගැනීමට ඔහුට කිසිදු ක්‍රමෝපායයක් නොතිබුණු නිසාය. ඔහු මුහුණ දුන් අභියෝග අතර ස්වාභාවිකව පැමිණෙන විපත් කෙරෙහි ඔහු බියෙන් තැති ගත්තේය. වසංගත රෝග, නියං, කුණාටු, අකුණුසැර, ජලගැලීම්, කාගේ වුවමනාවට සිදු වන දේද? එයින් විපතට පත් වන තම සගයන් දෙස බලා ඔහු තමන්ගෙන් ම ප්‍රශ්න කළේය. මේ සියල්ල කිසියම් අදෘෂ්‍ය මාන බලවේගයක ප්‍රතික්‍රියාවන් යැයි ඔහු අවසානයේ තීරණය කළේය. මේ බොහෝ දේ පසුකාලීනව ගොනු කරන ලද්දේ ආගම නම් ප්‍රපඤ්චය තුළටය.

ආගම තරම් පුද්ගලයාට සමීප වෙනත් කිසිදු සාරභෞම සංකල්පයක් සමාජයේ විද්‍යමාන නොවේ. පුද්ගලයා තමන්ගේ ජීවිතයේ පැන නගින ඕනෑම අර්බුදකාරී අවස්ථාවක නිතැතින් ම යොමු වන්නේ ආගම ධර්මය කෙරෙහිය. ඉච්ඡාභංගත්වයෙන් දැඩි ලෙස පීඩාවට පත් ඕනෑම අයෙක් අවසානයේ දනින් වැටෙන්නේ ආගම ඉදිරියෙහිය. තමන්ට ඇති හැම දුක්ගැනවිල්ලක් ම සිතින් නොඑසේ නම් මුවින් මුමුණා ඒ ඉදිරියෙහි ඔහු ප්‍රකාශ කරන්නේ, තමන්ට සිටින ලෙන්ගතු ම තැනැත්තෙකු ඉදිරියෙහි යමක් ප්‍රකාශ කරන්නාක් මෙනි. තමන්ගේ දුක් ගැනවිලි කාරුණිකව අසා සිට අගතියකින් තොරව තමන්ට සාධාරණයක් ඉටු කරති'යි යන විශ්වාසය ඔහු තුළ දැඩිව තිබේ. සමහර විට තමන්ට තමන්ගේ ප්‍රශ්නවලදී කිසිදු පිහිටක් පිළිසරණක් නොලැබුණ ද පුද්ගලයා කලකිරී එයින් ඉවතට නොයයි. නැවත නැවත ද ඔහු එහි ඇලී ගැලී කටයුතු කරයි. ඒ තරමට ම ආගම පුද්ගල ජීවිතය හා ඒකාබද්ධව පවතී. මිනිස් ඉතිහාසය පුරාම මේ ක්‍රියාවලිය දැකගත හැකිය. මැක්ස් මුලර් මහතා 'මිනිසාගේ ඉතිහාසය යනු ආගමේ ඉතිහාසය යයි' යනුවෙන් වරක් සඳහන් කළේ මේ නිසාය.

එහෙත් විද්වතුන්ගේ මතය වන්නේ, ආගම යන්න මිනිසා හා කෙතරම් සමීප සංකල්පයක් වුවත් ඒ සඳහා පැහැදිළි හා සර්ව

සාධාරණ අර්ථ කථනයක් සම්පාදනය කිරීම අතිශය දුෂ්කර කාර්යයක් බවයි. එයට ප්‍රධාන හේතුව දේවවාදී-අදේවවාදී, ප්‍රාථමික-උසස්, පෙරදිග-අපරදිග, ආදී වශයෙන් එකිනෙක ආගම්හි ඇති මූලික පිළිගැනීම් වල පවත්නා විෂමතාව යයි. එසේද වුවත් ආගම පිළිබඳ විවිධ අධ්‍යයනයන් සිදු කළ සමාජ විද්‍යාඥයන්, සමාජ මානව විද්‍යාඥයන් සහ ඉතිහාසඥයන්ගේ විශ්ලේෂණයන් ඔස්සේ ආගමක මූලික සංකල්ප, ලක්ෂණ සහ විශේෂතා මොනවාදැයි මෙහිදී විමසා බැලීම අත්‍යාවශ්‍ය වේ.

ආගම නම් වූ ප්‍රපඤ්චය පිළිබඳ අධ්‍යයනයකදී අපගේ අවධානය යොමු විය යුතු මූලික කරුණු කිහිපයක් තිබේ. ඒ අතර,

1. **ආගම යන්නෙහි මූලික අර්ථය**
2. **ආගමෙහි මූලික ලක්ෂණ**
3. **ආගමේ සම්භවය**
4. **ආගමෙහි කාර්යභාරය**
5. **ලෝක ආගම්**

යනාදිය ඒ අතර ප්‍රධාන වේ. සංක්ෂිප්ත වශයෙන් වුව ද මේ එක් එක් කරුණ ගැන යමක් සටහන් කළ යුතුය. එවිටයි, ආගම යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? යන්නත්, ආගමෙ සමාජ උපයෝගී තාවය කුමක්ද? යන්නත් අවබෝධ කරගත හැකි වන්නේ.

## ආගම යන්නෙහි මූලික අර්ථය

සිංහල භාෂාවෙහි 'ආගම' යන වචනය යෙදෙන්නේ 'කිසියම් ශාස්තෘවරයකුගේ ධර්ම මාර්ගයක්, උපදේශ ක්‍රමයක්, ප්‍රතිපත්ති මාර්ගයක් සහ ඒ වටා බැඳුණු වත් පිළිවෙත් සියල්ල ද හැඳින්වීම සඳහාය'.[1] ආගම යන වචනය කිසියම් ශාස්තෘවරයකුගේ



ඉගැන්වීම් පද්ධතියක් හැඳින්වීම සඳහා යෙදුනා සේම පැරණි සිංහල භාෂාවෙහි 'ධර්ම' යන වචනය ද ආගම යන්නට පරියාය වශයෙන් භාවිත වී ඇත. බුද්ධ ධර්මය, හින්දු ධර්මය, ජෛන ධර්මය යන යෙදුම් වලින් මෙය සනාථ වේ. මෙම පැරණි භාවිතයන් දෙස බලා මෑත ඉතිහාසයෙහි කතෝලික සහ ඉස්ලාම් ඉගැන්වීම් විෂයෙහි ද ධර්ම යන වචනය යෙදුනු බව පෙනේ. කතෝලික ධර්මය, ඉස්ලාම් ධර්මය වැනි යෙදුම් මේ සඳහා දැක්විය හැකිය.

'ආගම' යන වචනයෙහි සාමාන්‍ය ජන ව්‍යවහාරය මෙසේ වුවත් සිංහල කෝෂ ග්‍රන්ථවල 'ආගම' යන්නට අර්ථ රාශියක් දී තිබේ. ඒ අතර, **ලබ්ධිය, ඇදහීම, පාරම්පාරික ධර්මය, අවබෝධය, බැඳීම, පැමිණීම, සම්ප්‍රාප්තිය, එළඹීම, ශාස්ත්‍රය, දෘෂ්ටිය, ශාසනය, පෙළ දහම**,[2] ආදිය විශේෂයෙන් සඳහන් කළ හැකිය.

ඉංග්‍රීසි භාෂාවෙහි 'ආගම' යන්නට යෙදෙන ඉංග්‍රීසි වචනය "***Religion***"[3] යන්නයි. මෙම වචනය සෑදී තිබෙන ආකාරය පිළිබඳ විද්වතුන් අතර ප්‍රධාන මත දෙකක් තිබේ. කෙනෙක් සඳහන් කරන්නේ, '**Religion**' යන ඉංග්‍රීසි වචනය ලතින් භාෂාවේ එන **අල්ලා ගැනීම, එකතු කිරීම, ගණන් ගැනීම**, බැලීම යන අර්ථ දෙන '***Lig***' යන මූලයෙන් (ප්‍රකෘතියෙන්) සෑදුණු '***Religio***' යන්නෙන් බිඳී ආ බවයි. වෙනත් කෙනෙකුගේ මතය වී තිබෙන්නේ, ලතින් භාෂාවේ එන බැඳීම යන අර්ථය දෙන '***Leg***' යන මූලයෙන් (ධාතුවෙන්) උපන් '***Religio***' යන ලතින් වචනයෙන් '***Religion***' යන ඉංග්‍රීසි වචනය සෑදුණු බවයි.[4]

ලතින් භාෂාවේ එන '***Religio***' යන්න 'අල්ලා ගැනීම' යන අර්ථය ඇති '***Lig***' යන මූලයෙන් සෑදුනත්, බැඳීම යන අර්ථය ඇති '***Leg***' යන මූලයෙන් සෑදුනත් අර්ථකථනය කරන්නේ, එක්තරා ඥාතිත්වයක් පිළිබඳ හැඟීමක් ප්‍රකට කරන බවත් එම ඥාතිත්වය නම් මිනිසා සහ අතිමානුෂ බලයන් අතර පවත්නක් බවත් ලෙසය. ඒ අනුව '***Religio***' යන්නෙන් බිඳී එන '***Religion***'

යන ඉංග්‍රීසි වචනය අර්ථ කථනය කෙරෙන්නේ අතිමානුෂීය බලවේගයන් කෙරෙහි මිනිසා තුළ ඇති බැඳීම හෝ අල්ලා ගැනීම යන අර්ථය දෙන විශ්වාසය හා භක්තිය මත පදනම් වන ක්‍රියාවලිය ආගම බවයි. මෙම මූලික අර්ථය පදනම් කරගෙන විද්වතුන් විසින් විවිධ නිර්වචන සහ අර්ථකථන රාශියක් ඉදිරිපත් කර තිබේ.

## ආගමේ මූලික ලක්ෂණ

ආගමෙහි මූලික ලක්ෂණ මේවා යැයි නිෂ්චිතව කිව නොහැකිය. එයට හේතුව ආගම් විශාල ප්‍රමාණයක් තිබීමත් ඒ හැම ආගමක් ම එකිනෙකට වෙනස් වීමත්ය. එසේ ද වුවත් හැම ආගමකට ම පොදු හෙවත් සමාන ලක්ෂණ ද නැත්තේ නොවේ. මෙම සමානතා හා විෂමතා මොනවාද යන්න ආගම යන ප්‍රපඤ්චය පිළිබඳ විවිධ විද්වතුන් ඉදිරිපත් කර ඇති නිර්වචන සහ අර්ථකථනයන් තුළින් කිසියම් ප්‍රමාණයකට නිරාකරණය කර ගත හැකි වේ. ආගම පිළිබඳ පුළුල්ව පර්යේෂණාත්මක අධ්‍යයන් සිදු කළ විද්වතුන් අතර එඩ්වඩ් ටේලර්, ආර්. ආර්. මැරාට්, එමිල් ඩුර්කයිම්, රැල්ෆ් එච්. ටර්නර්, ජෝන් බවුකර්, මැක්ස් මුලර්, ජේම්ස් ප්‍රේෂර්, බ්‍රැනිස්ලෝ මැලිනොවුස්කි, කාල්මාක්ස්, ටැල්කොට් පාසන්ස්, ඔටෝ මාඩුරෝ, රොබට් බෙලා, ජෝර්ජ් මුවර්, හර්බට් ස්පෙන්සර්, මැක්ස් වේබර්, ජේ. මැක්ටගාට්, නිනියන් ස්මාර්ට්, ක්ලිෆර්ඩ්, යනාදී සමාජ විද්‍යාඥයන් සහ සමාජ මානව විද්‍යාඥයන් විශේෂ තැනක් ගනී. මොවුන් විවිධ දෘෂ්ටිකෝණවලින් බලා ආගමෙහි මූලික ලක්ෂණ පිළිබඳව මත පලකර තිබේ.

ලෝකයේ විද්‍යමාන ආගම් මූලික වශයෙන් කොටස් දෙකකට බෙදේ. එනම්,

1. ප්‍රාථමික ආගම්-***Primitive Religion***
2. උසස් ආගම්-***Higher Religion,*** වශයෙනි.



ප්‍රාථමික ආගම් වශයෙන් හඳුන්වනු ලබන්නේ නොදියුණු, යම් යම් ගෝත්‍රික සමාජයන්ට පමණක් සීමා වූ එම සමාජවල ක්‍රියාත්මක වන ආගමික මතවාදයන් ය. මේවා බොහෝදුරට අභිචාර විධි මත ක්‍රියාත්මක වන ඒ ඒ ගෝත්‍රයේ අනන්‍යතාව වශයෙන් පවත්නා ආගම්ය. ඒවායෙහි විද්‍යමාන විශේෂ ලක්ෂණයක් වන්නේ, ආගමික ජීවිතය හා සාමාජික ජීවිතය වශයෙන් වෙන් කළ නොහැකි තරමට ගෝත්‍රික චර්යා ධර්ම, ආගම සමග එකට බද්ධවී තිබීමයි. එසේ වුවත් සංඛ්‍යාත්මකව ගත්විට ලෝකයේ බහුල වශයෙන් දක්නට ලැබෙන්නේ ගෝත්‍රික ආගම්ය.

උසස් ආගම් යනු ශිෂ්ටාචාර ඔස්සේ පරිනාමය වී බහුල වශයෙන් ජන සමාජ අතර ප්‍රචලිත වී ඇති සහ ව්‍යාප්තවී ඇති ආගම්ය. කෙටියෙන් සඳහන් කරන්නේ නම් සංස්කෘතික වශයෙන් ගොඩනැගුණු ආගම් ලෙස උසස් ආගම් සඳහන් කළ හැකිය. එවන් වූ උසස් ආගම් අතර බෞද්ධ, **ක්‍රිස්තියානි, ඉස්ලාම්, යුදෙව්, හින්දු, ජෛන, සීක්, තාවෝ, ෂින්ටෝ, සරතුස්ත්‍රාගම,** විශේෂ තැනක් ගෙන තිබේ.

මෙම උසස් ආගම් නැවත කොටස් දෙකකට බෙදේ. එනම්,

1. දේවවාදී ආගම්-***Theistic***
2. අදේවවාදී ආගම්-***Atheistic,*** වශයෙනි.

ලෝකය සහ එහි වසන සියලු සත්වයන් ඇතුළු සජීවී, අජීවී හැම දෙයක් ම කිසියම් සර්වබලධාරී දෙවියකු විසින් නිර්මාණය කරන ලදැයි ද එම දෙවියන් විසින් මේ සියල්ල පාලනය කරන්නේ, යැයි ද අවසානයේ විශේෂයෙන් මිනිසාගේ විමුක්ති සාධනය ද දෙවියන්ගේ විනිෂ්චය මත සිදු වන්නේ, යැයි ද පිළිගන්නා ආගම් දේවවාදී ආගම් ලෙස මූලික වශයෙන් හඳුන්වා දිය හැකිය. මෙම නිර්මාණවාදී දේව සංකල්පය පිළිගන්නා ආගම් ලෙස ප්‍රධාන වශයෙන්

1. ක්‍රිස්තියානි ආගම. 2. ඉස්ලාම් ආගම. 3. හින්දු ආගම. 4. සීක් ආගම. 5. යුදෙව් ආගම. යන ආගම් වැදගත් කළ හැකිය.

අදේවවාදී ආගම් ලෙස සැලකෙන්නේ ඉහත සඳහන් නිර්මාණවාදී දේව සංකල්පය පිළිනොගන්නා ආගම්ය. ස්වභාව ධර්මය මත විශ්ව ක්‍රියාකාරිත්වය සිදු වන්නේ, යැයි පිළිගන්නා, කර්ම සංකල්පයට මුල් තැන දෙන, පුද්ගල විමුක්ති සාධනය බාහිර බලවේගයකට නොපවරන සහ එය තම තමන්ගේ වගකීමක් ලෙස අවධාරණය කරන මෙම ආගම් නිර්මාණවාදී දේව සංකල්පය ප්‍රතික්ෂේප කළ ද සාමාන්‍ය දේව සංකල්පය පිළිගනී. මෙම ගනයෙහිලා සැලකෙන ආගම් අතර

1. බුදුදහම
2. ජෛනදහම, ප්‍රධාන බව මෙහිලා සඳහන් කළ හැකිය.

ආගමක මූලික ලක්ෂණ හඳුනා ගැනීම සඳහා ඉහතින් සඳහන් කළ විද්වතුන් විසින් ආගම පිළිබඳව ඉදිරිපත් කළ අර්ථකථන සහ නිර්වචන මහත් පිටුවහලක් සපයයි. එබැවින් විශේෂයෙන් තෝරාගත් නිර්වචන කිහිපයක් කෙරෙහි අවධානය යොමු කරමු.

## ආගම පිළිබඳ නිර්වචන

1. ජේම්ස් ෆ්‍රේෂර්, 'ස්වභාව ධර්මය හා මිනිස් ජීවිතය පාලනය කර මෙහෙය වන්නේ යැයි සැලකෙන මිනිසාට වඩා උත්තරීතර බලයක් තමා කෙරෙහි පහදවා ගැනීමේ කාර්ය ක්‍රමය ආගම වේ.'[5]
2. ඊ.බී.ටේලර්, 'ආගම වනාහී අතිමානුෂ භූතාත්මයන් කෙරෙහි ඇති විශ්වාස යයි.'[6]
3. එමිල් ඩුර්කයිම්, 'ආගම වනාහී ශුද්ධ යයි සම්මත විශ්වාසයන් හා භාවිතයන් සමූහයක් වටා ගෙතුන අන්තර් රඳාපැවැත්මක් ඇති විශ්වාසයන් හා භාවිත ක්‍රමයක් මගින් සමාජයක සියල්ලන් ම එක් සදාචාර ප්‍රජාවක් ලෙසට සංවිධානය කරන ආයතනයකි.'[7]
4. රැල්ෆ් එච්. ටර්නර්, 'ආගම නම් ශුද්ධ අධිභෞතික දේ සම්බන්ධ වූ විශ්වාස හා යාතු කර්ම වටා ගොඩනැගී ඇති අන්‍යෝන්‍ය සම්බන්ධතාව ඇති තත්වයන්, කාර්ය කොටස්, හා ධර්මතාවන් ආදිය පිළිබඳ එකතුවකි. (මෙහි උපාංග තුනක් ඇති බව ඔහු කියයි.)



1. ශුද්ධ හා අධිභෞතික සියලු දෑ -Sacred and supernatural
2. විශ්වාස සහ ඇදහිලි -Belief and values
3. ඇදහිලි වාද සහ යාතු කර්ම -Cults and rituals[8]

මෙම නිර්වචනයන් කිසියම් ඒක පාර්ශ්වීය බවක් ගෙන තිබන බව පෙනේ. එනම් මේවායින් වැඩි වශයෙන් අවධාරණය කෙරෙන්නේ, නිර්මාණවාදී දේව සංකල්පය පිළිගන්නා දේවවාදී ආගමික ලක්ෂණ පිළිබඳවය. වෙනත් ආකාරයක සඳහන් කරන්නේ නම් අදේවවාදී ආගමික සංකල්ප මෙම නිර්වචන තුළින් ගිලිහී ගොස් ඇත. එනම් බුදුදහම, ජෛන දහම වැනි අදේවවාදී ප්‍රධාන ආගම් මෙයින් නොසලකා හැරීමක් සිදු කොට ඇත. එයට හේතුව ලෙස අපට පෙනී යන්නේ, මේ බොහෝ විද්වතුන් බටහිර ලෝකයෙන් පෝෂණය ලැබූවන් වීමය. ආගම යයි කී විට ඔවුන්ට නිරායාශයෙන් ම සිහියට එන්නේ, දේව නිර්මාණවාදී ආගමික සංකල්ප යයි.

කෙසේ වෙතත් මෙයින් ප්‍රකට වන එක් කරුණක් වන්නේ දේවවාදී සහ අදේවවාදී යන සියලු ආගම්වලට සාධාරණය ඉටුවන නිර්වචනයක් මෙතෙක් ඉදිරිපත්වී නැති බවයි. ඉහත සඳහන් නිර්වචනයන් අතරින් එක් නිර්වචනයක් කෙරෙහි අපගේ විශේෂ අවධානය යොමු කිරීම අවශ්‍ය යයි හැඟෙන්නේ එමගින් දේව අදේව යන උභය පක්ෂයට ම කිසියම් ප්‍රමාණයක

සාධාරණයක් ඉටුවී ඇතැයි පෙනී යන බැවිනි. එනම් එමිල් ඩූර්කයිම් විසින් ඉදිරිපත් කළ නිර්වචන යයි.

ඩූර්කයිම්ගේ නිර්වචනය තුළ ඍජුව ම නිර්මාණවාදය ගැන නොකිය වේ. ඔහු සඳහන් කරන්නේ, ශුද්ධ යයි සම්මත කිසියම් විශ්වාස හෝ භාවයන් පද්ධතියක් ගැනය. දේවවාදී ආගම්වල පමණක් නොව අදේවවාදී ආගම්වල ද පූජනීය වූ හෙවත් ශුද්ධ වූ යම් යම් දේ පිළිගැනේ. එමනිසා අදේවවාදී ආගම් පිළිබඳ අදහසක් ද මෙයින් ප්‍රකාශ වේ යයි හැඟේ. මෙම නිර්වචනයෙහි ඇති ඉතාම වැදගත් අනෙක් කරුණ වන්නේ කිසියම් සමාජයක සියලුම දෙනා එකම සදාචාර ප්‍රජාවක් ලෙස සංවිධානය කිරීමේ වගකීම ආගමේ එක් ප්‍රධාන කාර්යයක් ලෙස අවධාරණය කර තිබීමයි. 'මෙසේ ඩූර්කයිම්ගේ ආගම පිළිබඳ විග්‍රහය පරීක්ෂා කර බලන විට පැහැදිලි වන තවත් අදහසක් නම් එය අදියරයන් ගණනාවක් ඔස්සේ ගමන් කර අවසානයේ ආගම යයි හඳුනා ගත හැකි සංස්ථාවක්, සංවිධානයක් දක්වා පැමිණ ඇති බවය. එනම්,

1. ශුද්ධ වස්තුවක පැවැත්ම
2. එම ශුද්ධ වස්තුව පිළිබඳ විශ්වාසය
3. එම විශ්වාසය පදනම් කොට ඇතිකර ගනු ලබන පිළිවෙත්
4. එම පිළිවෙත් ක්‍රියාත්මක කිරීම සඳහා ගොඩනගා ගත් සංවිධාන, යනුවෙනි.'

මෙහිදී ඩූර්කයිම් අවධාරණය කරන්නේ කිසියම් ඉගැන්වීම් පද්ධතියක් තුළ මෙම කරුණු අන්තර්ගත වී ඇත් නම් එම ඉගැන්වීම ආගමක් ලෙස සැලකීමේ කිසිදු වරදක් නොමැති බවයි. කෙසේ වෙතත් මෙයින් අපට ආගමේ මූලික ලක්ෂණ මොනවාද යන්න කිසියම් ප්‍රමාණයකට තක්සේරු කළ හැකිය. (වෙනත් සාර්ථක මිනුමක් නොමැති බැවින්) මෙම නිර්වචනය ඒ සඳහා යම් මගපෙන්වීමක් සිදු කරයි.



### ආගමේ සම්භවය

ආගමේ සම්භවය නොඑසේ නම් ආගම බිහි වූයේ කෙසේද? යන්න විමසීම අතිශය සංකීර්ණ ප්‍රස්තුතයක් බව ඒ පිළිබඳව ඉදිරිපත් වී ඇති කරුණු විමසීමේදී පෙනී යයි. මේ සම්බන්ධයෙන් විද්වතුන් මත රාශියක් ඉදිරිපත් කර තිබේ. මේ සියලු මත එකිනෙක හා ගැටේ. බ්‍රැනිස්ලෝ මැලිනොවුස්කි සඳහන් කරන්නේ 'ආගම ප්‍රභවය ලැබුවේ මිථ්‍යාමායාවන් හා වැරදි විශ්වාසයන් නිසා ම නොව, මිනිස් ජීවිතයේ සත්‍ය හා යථාර්ථවාදී ලෙස දකින්නට ඇති බේදාන්තයන්, විශේෂයෙන් ම මිනිසාගේ සැලසුම් හා ඔහු මුහුණ දෙන යථාර්ථය අතර ඇති ගැටුම, ආගම මිනිසාට හඳුන්වා දීමට හේතු කාරක වූ බවයි.'[10] වෙනත් කෙනෙකුගේ මතය වී තිබෙන්නේ ආගම සමාජයේ සාධනීය මට්ටමක් පෙන්නුම් කරන බවයි. එනම් ආගම සමාජ සංස්කෘතියේ කිසියම් පැතිකඩක් බවයි. 'ආගම මානව ශිෂ්ටාචාරයේ වර්ධනීය අවස්ථාවක් පෙන්නුම් කරන සමාජ සංස්ථාවකි. මිනිසා කායික මානසික අංශවලින් යම් ප්‍රමාණයක දියුණුවක් ලැබූ අවස්ථාව වන විට තමා සහ තමා අවට පරිසරය පිළිබඳව ඇති වූ කුතුහලයත් බියත් ආගම් බිහිවීමට ප්‍රධාන හේතුව බව පෙනේ.'[11]

ස්වභාව ධර්මයේ අද්භූතජනක සිද්ධීන් අබියස අන්ත අසරණභාවයට පත් ආදිකාලීන මිනිසා බියෙන් තැති ගත්තේය. කුතුහලයෙන් වික්ෂිප්ත වූයේය. ඒවා පාලනය කරන්නට සමතෙක් මිහිපිට නැතැයි සිතූ ඔහු අධිභෞතික ශක්තීන් ඒවාට ආරූඪ කළේය. එහි ප්‍රතිඵලය වූයේ නිර්මාණවාදී ආගමික සංකල්ප පසු පස දිව යාමයි. 'ස්වභාව ධර්මය පිළිබඳ අද්භූත ආශ්චර්ය ජනක දේ සිදුවනු දැක බිය ඇතිව වුසූ ආදිම මනුෂ්‍යයා ගස්, ගල්, පර්වත, ගං, හෝ, දිය, ගිනි, අව්, වැසි, සුළං, ගෙරවිලි, සඳ, හිරු, අඳුර ආදිය දේවතා බලයකින් වන හාස්කම් ලෙස සිතන්නට විය. ස්වාභාවික වස්තුවලින් ලැබෙන ප්‍රයෝජනය

නිසා ඒවාට ගෞරවයක් ද, සැලසෙන උවදුරු නිසා භයක් ද, ඇතිකර ගත් ඔවුහු සැපත් ලබා ගැනීමටත් විපත් මගහරවා ගැනීමටත් මන්ත්‍ර ජප කරන්නට වූහ.[12] ආගමේ උපත මෙසේ යයි කෙනෙක් කීහ.

ස්වාභාවික පරිසරය සහ සාධක ඔස්සේ ආගමික සංකල්ප ගොඩනැගුනාය යන මතයට අමතරව වෙනත් සංකල්පයන් ද ආගමික සංකල්ප බිහිවීමට බලපාන්නට ඇතැයි වෙනත් කෙනෙක් තර්ක කරති. එනම් මළවුන් ඇදහීමේ චාරිත්‍ර යයි. මියගිය අය නැවත පැමිණෙතැයි යන විශ්වාසයත් එමනිසා ඔවුන්ගෙන් සිදු වන විපත් මගහරවා ගැනීමට ඔවුන් වෙනුවෙන් යම් යම් දේ කළ යුතුය යන අදහස ඔස්සේ ආගමික මතවාද ගොඩනැගෙන්නට ඇතැයි මොවුහු විශ්වාස කරති. 'මිනිසාගේ මරණයත් සමග ඔහු වෙතින් ඉවත් වන ආත්මය පෙරළා ජීවත්ව සිටින අයට බලපෑම් කරන බවත් එම බලපෑම හේතු කොට ගෙන ආත්මයට වැඳුම් පිදුම් කිරීමට ජනතාව පෙළඹෙන බවත් දක්වන ටයිලර් මෙම ආත්මය නැවත නැවත ඉපදීම සර්වාත්ම වාදය (***Animism***) ලෙසින් නම් කරයි. මෙසේ මිය යන සත්වයකුගේ ආත්මය මූලික වී ඇති වූ වන්දනය ආගම්වල අරම්භය වූ බැවින් ආගම හැඳින්විය හැක්කේ අධිභෞතික සත්ත්වයන් හෙවත් ප්‍රත්‍යක්ෂයට ගෝචර නොවන සත්ත්වයන් පිළිබඳව මිනිසා තුළ පවත්නා විශ්වාස ලෙසිනැයි ඔහු වැඩිදුරටත් දක්වයි.'[13]

විද්වතුන් විසින් ඉදිරිපත් කර තිබෙන මෙම එකිනෙකට වෙනස් වූ මතවාද සියල්ල සැලකිල්ලට ගත්විට අපට පැමිණිය හැකි වඩාත් යෝග්‍ය නිගමනය වන්නේ, මෙයයි. එනම් ආගමේ ආරම්භයට බලපෑ ප්‍රධාන සාධක දෙකක් තිබෙන බවයි. එම සාධක දෙක නම්,

1. පුද්ගලයාට තමා අවට ලෝකය හරිහැටි අවබොධ කර ගත නොහැකි වීම
2. මරණින් පසු තමන්ට සිදු වන්නේ කුමක්දැයි නොදැනීම



මෙම කරුණු දෙක විසඳා ගැනීම පිණිස ආගමික මත වාද ඒ ඒ පැරණි සමාජයන් තුළ ගොඩනැගී තිබෙන බව කරුණු පරීක්ෂා කිරීමේදී පෙනී යයි.

## ආගමේ කාර්යභාරය

ආගම නම් විෂය පිළිබඳව කථා කිරීමේදී න්‍යායාත්මක අංශය කෙසේ වෙතත් ප්‍රායෝගික වශයෙන් අපට ඉතා වැදගත් වන්නේ, මෙම මාතෘකාවයි. එනම් ආගමෙහි ප්‍රධාන කාර්යය වන්නේ කුමක්ද? යන්නයි. ආගමේ අර්ථය, ආගමේ මූලික ලක්ෂණ, ආගමේ සම්භවය යනාදිය සාමාන්‍ය පොදු ජනයාට වැදගත්කමක් ඇති දේ නොවේ. සමාජය අවධානය යොමු කරන්නේ, මෙමගින් සමාජයට සිදු වන මෙහෙය කමක්ද? යන්න පිළිබඳවයි. එහෙත් ශාස්ත්‍රීය අධ්‍යයනයකදී උක්ත කාරණා නොසලකා හැර ආගමේ මෙහෙවර පිළිබඳව පමණක් අපට කථා කළ නොහැක්කේ, එය අසම්පූර්ණ සහ අවිධිමත් අධ්‍යයනයක් වන නිසාය.

අප ඉහතින් සඳහන් කළ පරිදි ආගම බිහි වූයේ මිනිසාට, මිනිසා අවට පරිසරය හරිහැටි තේරුම් ගැනීමට නොහැකි වීමත්, මරණයෙන් පසු තමන්ට සිදු වන්නේ කුමක්දැයි යන්න පිළිබඳවත්, සෙවීමට ගත් උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙනි. මෙම අදහස් දෙක නැත්නම් කරුණු දෙක තවත් සම්පිණ්ඩනය කරගත් විට 'නොපෙනෙන ලෝකය කෙරෙහි මිනිසුන් තුළ පැවති කුතුහලය නිසා ඇති වුණු බිය මුසු ගෞරවය ආගම බිහිවීම සඳහා පාදක වී ඇතැයි' පෙන්වා දිය හැකිය.

කෙසේ වෙතත් මෙසේ බිහි වන ආගමෙන් පෞද්ගලික වශයෙන් පුද්ගලයාත්, පොදුවේ සමාජයත් අපේක්ෂා කළ සහ කරන ප්‍රධාන කාර්යභාරය කුමක්ද? ආගමෙන් ආගමට, ආගමේ ඉගැන්වීම් වෙනස් වන බැවින් ඒ ඒ ආගම් වල අවසාන අරමුණ, පරමාර්ථය සාක්ෂාත් කරගැනීම පිණිස ඉදිරිපත් කරනු ලබන ක්‍රියාවලිය ඔස්සේ සිදු කෙරෙන කාර්ය භාරයෙහි ද යම් යම්

වෙන්සකම් පවතී. එහෙත් මෙහිදී ආගමේ කාර්යභාරය වශයෙන් අදහස් කරන ලද්දේ එවැනි වෙන් වෙන් වූ කාර්ය නොවේ. පොදුවේ ආගම නම් ප්‍රපඤ්චය මගින් සමස්ත සමාජය අපේක්ෂා කරන කාර්ය යයි. එය අන් කිසිවක් නොව ඉහත සඳහන් කළ ආගම බිහිවීමට ද බලපෑ මූලික කාරණාවලට ද අනුකූලව සලකා බැලුව විට නොපෙනෙන ලෝකය හරිහැටි හෙවත් යථා පරිදි තේරුම් ගැනීමටත්, එයින් මෙලොව වශයෙනුත්, මරණින් පසුත් පුද්ගලයාට එල්ලවන අභියෝග ජය ගැනීම පිණිසත් අවශ්‍ය මග පෙන්වීම ලබාදීම වේ. ආගමෙන් ආගමට ප්‍රධාන ආගමික සංකල්ප වෙනස් වුව ද පුද්ගලයාට සහ සමාජයට මෙම මග පෙන්වීමේ කාර්යය සඳහා සෑම ආගමක් ම පොදුවේ පිළිගනු ලබන සහ ඉදිරිපත් කරනු ලබන එක් ප්‍රධාන මිනුමක් හෙවත් මෙවලමක් (Tool) තිබේ. එනම් හොඳ නරක පිළිබඳ සංකල්ප යයි. හොඳ කිරීමෙන් දෙන ලද ආගමෙහි අරමුණ ඉටුකර ගැනීමට මහත් රුකුලක් වන බවත් නරක කිරීමෙන් දෙලොව ම පරාජිත තත්වයට පත්වන බවත් ආගම කියා දෙයි. මේ ඔස්සේ ආගම සිදු කරන මූලික කාර්යභාරය වන්නේ,

1. **සදාචාර සම්පන්න සමාජයක් බිහි කිරීමට මග පෙන්වීම**
2. **මෙලොව සහ මරණින් මතු ජීවිතය ජය ගැනීමට මග පෙන්වීම**

එමිල් ඩුර්කයිම් තමන්ගේ ආගම පිළිබඳ නිර්වචනයේ ද සඳහන් කර තිබෙන්නේ, සමාජයේ සියලු දෙනාම එකම සදාචාර සම්පන්න කණ්ඩායමක් බවට පෙළ ගැස්වීම ආගමේ මූලික කාර්යය වන බවයි.

## ලෝක ආගම්

මීට ඉහතදී ද ලෝකයේ පවත්නා ආගම් ප්‍රාථමික සහ උසස් (***Primitive and Higher***) වශයෙන් කොටස් දෙකකට බෙදෙන බව දක්වන ලදී. එහි අර්ථය ද පැහැදිලි කෙරිනි. ලෝක ආගම්



ගනයෙහිලා සැලකෙන්නේ, මෙයින් උසස් ආගම් වශයෙන් ගැනෙන ආගම්ය. ලෝකයේ උසස් ආගම් ඇත්තේ ඉතාම සුළු ප්‍රමාණයකි. ඒ අතර **බෞද්ධ, ක්‍රිස්තියානි, ඉස්ලාම්, යුදෙව්, හින්දු, ජෛන, සීක්, තාවෝ, ෂින්ටෝ, සරතුස්ත්‍රාගම**, යනාදිය මෙම ගනයෙහි ආගම් ලෙස සැලකේ. ආගමක තිබිය යුතු මූලික ලක්ෂණ මෙම ආගම්හි නොඅඩුව පවත්නා බව මෙහිලා විශේෂයෙන් සඳහන් කළ හැකිය. ලෝක ජනගහනයෙන් වඩාත් වැඩි පිරිසක් මෙම ආගම් අනුගමනය කරන බව ද විශේෂයෙන් පෙන්වා දිය හැකිය.

## බුදුදහමෙහි ආගමික ලක්ෂණ

බෞද්ධ ඉතිහාසයෙහි සමකාලීන අවධිය තරම් (19 වන සියවසේ අගභාගයේ සිට මේ දක්වා කාලය) බුදුදහම පිළිබඳ ලෝකය පුරා ම, කථා කෙරෙන, පොත පත ලියවෙන, පර්යේෂණ අධ්‍යයන සිදු කෙරෙන සහ කෙරුණු වෙනත් කාලවකවානුවක් දක්නට නැති තරම්ය. විවිධ භාෂාවලින් ලියවී ඇති පොත පත පිළිබඳ පමණක් සැලකුවත් ඒවා දස දහස් ගණනක් වනු නොඅනුමාණය. වෙනත් ආගමකට, දහමකට නොමැති තරම් විශේෂ ආකර්ෂණයක් බුදුදහම කෙරෙහි පතිත වී තිබෙන්නේ, නිර්මාණවාදී දේව සංකල්පයෙන් හා ආදානග්‍රාහී භක්තිවාදී ආගමික සංකල්පයන්ගෙන් විද්වත් ලෝකයා හෙම්බත්වී සිටීම නිසාය. එනම් නවීන ලෝකයේ දැනුමට සරිලන නිදහස්වාදී චින්තනයක් බුදු දහමෙන් බැහැර සමය සමයාන්තරයන්හි දක්නට නොමැති වීමයි.

අනෙක් අතට මෙම නිදහස්වාදී බෞද්ධ චින්තනය විවිධ විෂය ක්ෂේත්‍ර හා තුලනය කර ඉදිරිපත් කර තිබෙන පර්යේෂණන්ගේ වාස්තවිකත්වය ද මෙම ආකර්ෂණීය තත්වයට හේතුපාදක වී ඇත. මේ අතර බහුල වශයෙන් දක්නට ලැබෙන්නේ, අළුත් දැනුම හෙවත් නවීන විද්‍යාත්මක දැනුම

සොයා යන ලෝකයට සරිලන ලෙස බුද්දහම ගැලපීමට ගන්නා ලද උත්සාහයන්ය. වෙනත් ආකාරයකට සඳහන් කරන්නේ නම් බුද්දහම විද්‍යාවට සම විෂම වන අයුරු පිළිබඳව කෙරෙන අධ්‍යයනයන් සහ පර්යේෂණයන් බහුල බවයි. එයට ප්‍රධාන එක් හේතුවක් වන්නේ, නවීන ලෝකයේ විද්‍යාත්මක දැනුමට තිබෙන ඉහළ උපයෝගීතාව යයි.

විද්‍යාත්මක ඥානය ඉතාම වේගයෙන් අළුත් වන අතර එයට සාපේක්ෂකව අනෙකුත් දැනුම් පද්ධතීන් ද වෙනස් විය යුතුය. නොඑසේ නම් ඒ සමග යා යුතුය. අළුත් විය යුතුය. එසේ නොවුව හොත් ඒවා නිරායාසයෙන් ම භාවිතයෙන් ඉවත්වී අවලංගු වී යයි. ඒ අනුව සලකන විට අනෙකුත් සියලු ම දේවවාදී සහ අදේවවාදී ආගමික පද්ධතීන් අභිබවා නවීන ලෝකය සමග උරෙනුර ගැටී ගමන් කිරීමේ හැකියාව ඇත්තේ බුද්දහමට පමණක් යැයි කීම අතිශයෝක්තියක් නොවේ. 'නූතන විද්‍යාත්මක ඥානය දියුණුවීම නිසා බොහෝ ආගම් චණ්ඩ මාරුතයකට හසුවූ කෙසෙල් ගස් මෙන් ඇද වැටෙද්දී බුද්දහම ඉන්ද්‍රඛීලයක් සේ නැගී සිටින්නේ, එබඳු විශිෂ්ට දර්ශන ස්වභාවය හේතුවෙනි.'[14]

එහෙත් මෙහිදී එක් විශේෂ දෙයක් අවධාරණය කළ යුතුය. එනම් නවීන විද්‍යාත්මක සොයා ගැනීම් සහ එම ඥානය සමග බුද්දහමේ එන ඉගැන්වීම් යම් යම් ප්‍රමාණයන් ගෙන් ගැලපුණු පමණින් බුද්දහම විද්‍යාත්මක යයි කීම යෝග්‍ය නොවන බවයි. මෙම අදහස සාධාරණීකරණය කිරීම සඳහා මෙහිදී එක් කරුණක් පමණක් ගෙනහැර දක්වමු. එනම් බුද්දහමේ උගන්වන සත්‍ය සහ විද්‍යාවේ උගන්වන සත්‍ය අතර පවත්නා වෙනස කෙබඳු ද යන්නයි.

බුද්දහමේත් විද්‍යාවේත් යන දෙකෙහි ම යම් යම් ප්‍රමාණයන්ගෙන් සත්‍ය ගැන කථා කෙරේ. එහෙත් බුද්දහමේ උගන් වන සත්‍ය හා විද්‍යාවේ උගන් වන සත්‍ය අතර සංකල්පීය



වශයෙන් අහසට පොළව මෙන් දුරස්වූ වෙනසක් තිබේ. විද්‍යාවේ සත්‍ය සොයන මාර්ගය වන්නේ, නිරීක්ෂණ, පරීක්ෂණ, සම්පරීක්ෂණ පදනම් කොටගත් උද්ගාමී තර්කණ යයි. උද්ගාමී තර්කණයෙහි ඇති විශේෂ ලක්ෂණය වන්නේ, විශේෂ සිද්ධි අධ්‍යයනයෙන් සාමාන්‍ය කරණයක් ගොඩනගා ගැනීමයි. එම සාමාන්‍යකරණය තුළ ඇත්තේ සම්භාවිතාමය සත්‍ය යයි. එයට හේතුව සාමාන්‍ය කරණය සඳහා පරීක්ෂණයට හෝ නිරීක්ෂණයට භාජනය විය යුතු කරුණු හෝ සිද්ධි අසීමිත සංඛ්‍යාවක් අතරින් පරීක්ෂණයට හෝ නිරීක්ෂණයට භාජනය වන්නේ, ඉතා සීමිත ප්‍රමාණයක් බැවිනි. යම් ලෙසකින් නිගමනයට (සාමාන්‍ය කරණයට) පැමිණීමෙන් පසු පරීක්ෂණයට හෝ නිරීක්ෂණයට භාජනය නොවූ කරුණක්, එළඹුණු නිගමනය වෙනස් කිරීමට ප්‍රබල සාධකයක් විය හැකි නිසා විද්‍යාත්මක සත්‍ය හැමවිට ම නිශ්චිත නොවී සම්භාවිතාමය අගයක් ගනී.

මේ නිසා විද්‍යාත්මක සත්‍ය නිරන්තරයෙන් චලනය වේ. අද සත්‍ය යැයි පිළිගත් දෙය හෙට හෝ තව මොහොතකින් අසත්‍යයක් බවට පත්වී නොඑසේ නම් සංශෝධනය වී වෙනත් දෙයක් සත්‍ය ලෙස පිළිගැනීමට ඉඩ තිබේ. කෙටියෙන් සඳහන් කරන්නේ නම් විද්‍යාත්මක සත්‍යයෙහි කිසිදු ස්ථාවර බවක් හෝ නිශ්චිත බවක් නැත. එහෙත් බුදු දහමේ සන්දර්භය මීට වඩා හාත්පසින් ම වෙනස් වේ.

බුදු දහම ද යම් ප්‍රමාණයකින් සත්‍ය සෙවීමේ ක්‍රමවේදය ලෙස පාවිච්චි කරන්නේ, උද්ගමන වාදයයි. එහෙත් විද්‍යාවේ මෙන් එහි සිද්ධි අධ්‍යයනයට සීමා පැනවීමක් නොකෙරේ. අනෙක් අතට විද්‍යාව පියවි ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂයෙන් ඔබ්බට යන්නේ නම් ඒ බාහිර උපකරණ භාවිතයෙනි. නිදසුන් ලෙස පියවි ඇසට නොපෙනෙන දෙය සියුම් උපකරණ භාවිතයෙන් (අන්වීක්ෂය හෝ දුරේක්ෂය) දැන ගත්ත ද එය විශ්ලේෂණය කෙරෙන්නේ, නැවත සාමාන්‍ය බුද්ධියෙනි. එහෙත් බුදු දහම පියවි ඉන්ද්‍රිය

ප්‍රත්‍යක්ෂය පදනමෙහි තබා ගෙන ඉන් ඔබ්බට ගොස් අතීන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය ද භාවිත කරයි. අතීන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය තුළ ගොඩනැගෙන ඥානය යථාභූත ඥාන යයි. එහි වැරදීමක් හෝ සංශෝධනයක් සිදු නොවේ. ඒ තුළ ගොඩනැගෙන, ස්ථාපිත වන සත්‍ය පරමාර්ථ සත්‍ය යයි. නිශ්චිත සත්‍ය යයි. නොවෙනස් වන සත්‍ය යයි.

මේ අනුව විද්‍යාවේ එන සම්භාවිතාමය සත්‍යයත් බුද්දහමේ එන නොවෙනස් වන සත්‍යයත් එකක් යැයි කීම පරස්පර විරෝධී කියමනකි. මේ දෙක දෙකක් මිස එකක් නොවේ. නොදැනීම නිසා හෝ අනවබෝධය නිසා ඇතිවී තිබෙන මෙම පටලැවිල්ල විසඳාගත යුතුය. බුදුදහමේත් විද්‍යාවේත් මීට අමතරව තවත් වෙනස්කම් ඇති බව පෙනේ. යම් යම් සමානකම් ද නැතුවා නොවේ. එහෙත් ප්‍රධාන කරුණ වූ හෙවත් පදනම වූ සත්‍ය පිළිබඳ සංකල්පයේදී බුදුදහම විද්‍යාත්මක යැයි කීම මොනතරම් සාවද්‍ය දැයි මෙයින් පෙනී යයි. අනෙක් අතට විද්‍යාත්මක ඥානය ලෞකික විෂයයක් බවත් බුදුදහමේ ඥානය අලෞකික හෙවත් ලෝකෝත්තර බවත් සැලකීමෙන් විද්‍යාව මිනුම් දණ්ඩ කොට බුදුදහම ඇගයීම කෙතරම් හානිදායක ක්‍රියාවක් ද යන බව තේරුම් ගත යුතුය.

කිසියම් විෂය ධාරාවක් වෙනත් විෂය ධාරාවක් සමග තුලනය කිරීමේදී ඒ සඳහා අදාළ මිනුම් දඬු නිවැරදිව පාවිච්චි කළ යුතුය. නිදසුන් ලෙස කිසියම් දෙයක් විද්‍යාත්මක යැයි කියන විට, යමක් විද්‍යාත්මක වීම සඳහා යොදාගනු ලබන මිනුම් දඬු කෙරෙහි අවධානය යොමු කළ යුතුය. යමක් ඒ අදාළ මිනුම් දණ්ඩෙන් මැනේ නම් එය ඒ නමින් හැඳින් වීමෙහි කිසිදු වරදක් නැත. ඒ අනුසාරයෙන් ගත් විට බුදුදහම විද්‍යාත්මක යැයි කීමට විද්‍යාව මැණෙන මිනුම් දඬු මොනවාද? ඒ මිනුමෙන් බුදුදහම මැනිය හැකිද? යන්න කෙරෙහි විද්වතුන් අවධානය යොමු කර ඇතැයි නොහැඟේ. මෙහි සිදුවී ඇති වැරැද්ද අන්කිසිවක් නොව ජනප්‍රිය වූ විද්‍යාවේ ජනප්‍රියත්වය බුදුදහමට ලබා ගැනීමේ වුවමනාව



නිසා මෙම නිගමනයන්ට පැමිණ ඇති බවයි. මේ නිසා විද්‍යාවට නොව බුදුදහමට නම් මහත් හානියක් නොදැනුවත්ව ම සිදුවී ඇති බව මෙහිලා විශේෂයෙන් සඳහන් කළ යුතුය.

බුදුදහම පිළිබඳ වර්තමානයේ ඇතිවී තිබෙන ගවේෂණශීලී ආකල්පය කොතෙක් දුරට සමාජ තුළ ව්‍යාප්ත වී ඇද්දැයි ඉහත කරුණුවලින් පෙනී යනු ඇත. මෙම ගවේෂණශීලී ආකල්පයෙන් බුදුදහම දෙස බැලීමේ ප්‍රවනතාවයෙහි තවත් අවස්ථාවක් ලෙස දසක කිහිපයක සිට විද්වතුන් අතර කතාබහට ලක් වන 'බුදුදහම ආගමක්ද? දර්ශනයක්ද?' යන ගැටළුව ඉදිරිපත් කළ හැකිය. බුදුදහම විද්‍යාත්මක යැයි කීමට ගත් ප්‍රයත්නය මෙන් මේ පිළිබඳව ද බොහෝ රචනා ඉදිරිපත්වී ඇත. එහෙත් මෙහිදී අපගේ මූලික අභිප්‍රාය වන්නේ බුදු දහමෙහි ආගමික ලක්ෂණ කෙතෙක්දුරට විද්‍යමානවේද යන්න විමසා බැලීමටය.

ආගම පිළිබඳ මත පල කළ සමාජ විද්‍යාඥයන්ගේ සහ සමාජ මානව විද්‍යාඥයන්ගේ අදහස් ඇසුරින් කිසියම් ඉගැන්වීමක් හෝ විශ්වාස පද්ධතියක් ආගමක් ලෙස පිළිගැනීමට නම් එය කුමන අංග ලක්ෂණයන්ගෙන් සමන්විත විය යුතු ද යන්න ඉහතදී සවිස්තරව සාකච්ඡාවට බඳුන් විය. එහිදී තහවුරු වුණු එක් ප්‍රධාන කාරණාවක් වූයේ, ආගම් මැනීම සඳහා නිශ්චිත වූ පොදුවේ පිළිගත් එක් මිනුම් දණ්ඩක් නැති බවයි. විද්වතුන් විසින් ඉදිරිපත් කරන ලද මිනුම් දඬු සහ නිර්වචන අතර බොහෝ පරස්පරතාවන් පැවතීමත් විශේෂයෙන් නිර්මාණවාදී දේව සංකල්පයෙන් බැහැර වූ ආගමික සම්ප්‍රදායයන් ලෝකයේ පවතිනවා යන්න අමතක කොට එම මතවාද ඉදිරිපත් කර තිබීමත් මෙයට ප්‍රධාන හේතුවයි. කෙසේ වෙතත් මෙහිදී, පවත්නා එම මිනුම් දඬු අතරින් සියලු ආගම්වලට වඩාත් සාධාරණයක් ඉටුවේ යැයි හැඟෙන මිනුමක් පාවිච්චි කිරීම හැර වෙනත් විකල්පයක් අපට නැති බැවින් බුදුදහම ආගමක් වේද, නොවේද යන්න ඒ ඔස්සේ විමසා බැලීමට මෙයින් ප්‍රයත්න දරමු.

මීට ඉහතදී සාකච්ඡා කළ මිනුම් දඬු අතරින් එමිල් ඩූර්කයිම්ගේ නිර්වචනය ඔස්සේ බුදුදහමේ ආගමික ලක්ෂණ මොනවාදැයි සොයා බැලීම යෝග්‍ය යැයි මෙහිදී අපි යෝජනා කරමු. එහෙත් එය එක ම සහ සර්ව සම්පූර්ණ මිනුම යැයි අපි නොකියමු. එම නිසා මෙයින් බුදුදහමට කෙතෙක් දුරට සාධාරණය ඉටුවේද යන්න පිළිබඳව දෙවරක් සිතා බැලිය යුතුය.

එමිල් ඩූර්කයිම්ට අනුව ආගමක මූලික ලක්ෂණ හතරක් තිබේ. එනම්,

1. ශුද්ධ වූ වස්තුවක පැවැත්ම පිළිගැනීම
2. එම ශුද්ධ වස්තුව පිළිබඳ විශ්වාස පද්ධතියක් තිබීම
3. එම විශ්වාසය පදනම් කොට ඇතිකර ගනු ලබන වත් පිළිවෙත් තිබීම
4. එම වත් පිළිවෙත් ක්‍රියාත්මක කිරීම සඳහා ගොඩනගාගත් සංවිධානයක් තිබීම, යන කරුණු හතරයි.

මෙම මිනුමට අනුව බුදුදහම ආගමක් ලෙස සැලකීමෙහි යුක්ති යුක්ත භාවය සංක්ෂිප්ත වශයෙන් පිරික්සා බලමු.

මෙහි පළමු කරුණ ලෙස දක්වා තිබෙන ශුද්ධ වස්තුවක පැවැත්ම යැයි පවසන්නේ පූජනීය බව (***sacred***) පරිපූර්ණ බව (***perfectness***) සහ දිව්‍යමය (***divine***) බව වේ. මෙයින් පූජනීය බව හා පරිපූර්ණ බව මිස දිව්‍යමය බව බුදුදහම හා සම්බන්ධව අදාළ නොවේ. බුදුදහම අදේවවාදී ආගමක් වන බැවිනි. බුදුදහමේ පූජනීය දේ ලෙස සැලකෙන්නේ බුද්ධ, ධම්ම සහ සංඝ යන ත්‍රිවිධ රත්නයයි. මීට අමතරව බුදුන් වහන්සේ වෙනුවෙන් පූජනීයත්වයට පත් කරගත් තවත් බොහෝ දේද පවතී. ධාතු වන්දනාව සහ බෝධි වන්දනාව ඒ අතර කිහිපයකි.

බුදුන් වහන්සේ පූජනීය වන්නේ සාමාන්‍ය ලෞකිකත්වය ඉක්මවූ හා ලෝකෝත්තර තත්ත්වයට පත්වූ නිසාය. ධර්මය



පූජනීය වන්නේ එය ලෝකෝත්තර බව සාධනය සඳහා මග පෙන්වන නිසාය. සංඝයා පූජනීය වන්නේ ලෝකෝත්තර මගෙහි ගමන් ගන්නා නිසාය. එමිල් ඩූර්කයිම් ශුද්ධ වස්තුවක් ලෙස අර්ථ කථනය කරන්නේ කිසියම් දිව්‍යමය ස්වභාවයකින් පැනනැගුණු හෝ දිව්‍යමය සම්බන්ධයක් ඇති බව ද යන අදහසිනි. එනම් මිනිසත්බව ඉක්මවූ දිව්‍යමය බවකි. එහෙත් බුදුදහමෙහි එවන්වූ දිව්‍යමය සම්බන්ධයක් කිසිවිටෙකත් පිළිගන්නේ නැත. වරක් බමුණකු බුදුන් වහන්සේ හමුවට පැමිණ තමන් වහන්සේ කවරෙක්දැයි විමසූ විට උන්වහන්සේ ප්‍රකාශ කර සිටියේ තමන් දෙවියෙකු හෝ බ්‍රහ්මයකු හෝ ගාන්ධර්වයකු හෝ යක්ෂයකු හෝ මනුෂ්‍යයකු හෝ නොවන බවයි.

එහිදී වැඩිදුරටත් කරුණු දක්වමින් උන්වහන්සේ තමන් වහන්සේව හඳුන්වා දුන්නේ තමන් මනුෂ්‍යයකු වුවත් සාමාන්‍ය මනුෂ්‍ය ස්වභාවය ඉක්ම වූ උත්තරීතර මනුෂ්‍යයකු බවයි. නිදසුනක් මගින් එය පැහැදිලි කරන උන්වහන්සේ පෙන්වා දෙන්නේ ජලයෙහි වැඩුණු පියුමක් ජලයෙහි නොගෑවී නොගැටී ජලයෙන් මතුපිටට පැමිණ පිපී තිබෙන්නාක් මෙන් සියලු ආශ්‍රවයන් ක්ෂය කොට තමන් උත්තරීතර මනුෂ්‍යභාවය ලබා ඇති බවයි.[15] මෙහි උත්තරීතර බව නම් ඉහත සඳහන් කළ ලෝකෝත්තර බවයි. ලෞකිකත්වයෙන් මිදුණු ලෝකෝත්තර බව තුළ ඇත්තේ නික්ලේශී, නිෂ්පාපී, සහ පරිපූර්ණ බවකි. මෙහි ඇති විශේෂත්වය වන්නේ, මේ තත්වය ඇති කර ගැනීම සඳහා කිසිදු නොපෙනෙන දිව්‍යමය ශක්තියක් හෝ බලවේගයක් උපයෝගී කර නොගැනීමයි. අනෙකුත් ආගමික සම්ප්‍රදායයන් හා සැසඳීමේදී මෙහි පවත්නා සුවිශේෂීතාවය ද මෙය බව පැහැදිලිව පෙන්වාදිය හැකිය.

එමිල් ඩූර්කයිම් සෘජුව ම සඳහන් නොකළ ද ශුද්ධ වස්තුවක් පිළිබඳ සංකල්පය තුළින් පෙන්වාදීමට උත්සාහ ගෙන ඇත්තේ කිසියම් දිව්‍යමය සම්බන්ධයකින් පහළ වූ හෝ ගොඩනැගුණු

යමක් පවතිනවා යැයි පිළිගැනීම බව අනුමාන කළ හැකිය. කෙසේ වෙතත් දේවවාදී හෝ අදේවවාදී ඕනෑම ආගමක ශුද්ධ වූ, පූජනීය වූ හා පරිපූර්ණ වූ යම් යම් දේ පිළිගන්නා අතර බුදුදහමෙහි එහි ප්‍රධානත්වය බුද්ධ චරිතයට හිමි වන බව ඉතා පැහැදිලිය. එසේම ධර්මය හා සංඝයාට ද මේ පූජනීයත්වය එකසේ පිරිනැමේ.

දෙවැන්න එම ශුද්ධ වස්තුව පිළිබඳව, අදාළ සන්දර්භය තුළ ගොඩනැගෙන විශ්වාස පද්ධතියයි. බුදුදහමෙහි මේ සඳහා යෙදෙන ප්‍රධානතම සංකල්පය ලෙස 'සද්ධා' යන්න ගත හැකිය. නිර්මාණවාදී දේව සංකල්පය පිළිගන්නා ආගමික සන්දර්භ තුළ මේ සඳහා ව්‍යවහාර වන්නේ 'භක්තිය' යන්නයි. ව්‍යවහාරික භාෂාව තුළ 'භක්තිය'[16] යන්න 'සද්ධා'[17] යන්නට පරියාය වශයෙන් යෙදේ. එහෙත් බෞද්ධ සන්දර්භය තුළ 'භක්තිය' යන්න 'සද්ධා' සංකල්පයට සමාන නොවේ. මේ දෙක අතර පැහැදිලි වෙනසක් තිබේ.

බුදුදහමෙහි උගන්වන සද්ධා සංකල්පය දෙයාකාරය. 'බුදුන් වහන්සේ ශ්‍රද්ධාවෙහි දෙයාකාරක ප්‍රභේදයක් දක්වමින්, එකක් නම්, අමූලිකා සද්ධා හෙවත් පදනමකින් තොරවූ, අතාර්කික ශ්‍රද්ධාව බවත්, අනික නම් ආකාරවතී සද්ධා හෙවත් විචාර බුද්ධිමය වූ ශ්‍රද්ධාව බවත් දෙසූහ. පළමුවැනි වර්ගයේ ශ්‍රද්ධාව ගර්හාවට ලක් කළ අතර දෙවැන්නෙහි ප්‍රයෝජනවත් බව ඇතැයි දක්වමින්, එය විද්‍යාඥයකු විසින් පසුව සත්‍යක්ෂණය කර දැනගන්නා අටියෙන් භව්‍යතාවක් ඇති හෙයින් තාවකාලිකව පිළිගන්නා වූ උපන්‍යාසයක් කෙරෙහි එම විද්‍යාඥයා තබන්නා වූ විශ්වාසයට සමාන යැයි වදාළහ. උපන්‍යාසය සත්‍යක්ෂණය කළ පසු විද්‍යාඥයා විශ්වාසය අත්හැර අවබෝධය ලබන්නේ කෙසේද ඒ ආකාරයෙන් ම බෞද්ධයා ද නිර්වාණය අවබෝධ කරගත් පසු ශ්‍රද්ධාව අත්හළ පුද්ගලයකු බවට පත් වන්නේය.[18] මෙයින් පෙනී යන්නේ භක්තිය යන්න අමූලික සද්ධා ගණයට



වැටෙන බවයි. එහි ඇත්තේ දෙන ලද කිසියම් දෙයක් පිළිබඳ ගෞරවය සහ යටහත් බව මත පදනම් වන විශ්වාසයයි. එම දෙන ලද කිසියම් දෙය විචාරයට හෝ විමසීමට භාජනය කිරීමක් එහි සිදු නොවේ.

කෙසේ වෙතත් බුදුදහම තුළ පැහැදිලිව ම ඉහත සඳහන් කළ පරිදි තුණුරුවන් කෙරෙහි පැවතිය යුතු විශ්වාස පද්ධතියක් පිළිබඳ සාකච්ඡා කෙරෙන අතර එය තුණුරුවන් කෙරෙහි පැහැදිලි අවබෝධයක් ලබන තෙක් පමණක් පැවතිය යුත්තක් බවත් වැඩිදුරටත් අවධාරණය කෙරේ. එනම් කිසියම් කෙනෙකු තුළ පවතින විශ්වාසය, මාර්ග ඵල ලබා නිර්වාණාවබෝධය ලබන තෙක් පවතින්නක් බවත් ඉන් පසුව විශ්වාසය පූර්ණ අවබෝධයක් බවට පරිවර්තනය වන බවත් බුදුදහමෙහි දක්වා තිබේ.[19]

අගමික ලක්ෂණ අතර ඇති තුන්වෙන් කරුණ වන්නේ ඉහතින් සඳහන් කළ විශ්වාස මත ගොඩනැගෙන වත් පිළිවෙත්ය. ආගමක අනිවාර්ය අංග ලක්ෂණයකි, වත් පිළිවෙත්. (ආගමේ ආචාර ධර්ම පද්ධතිය වශයෙන් මෙය සැලකිය හැකිය.) වත් පිළිවෙත් ගොඩනැගෙන්නේ, ආගමෙහි උගන්වන අරමුණු සහ සංකල්පවලට සාපේක්ෂකව. ආගමික වත් පිළිවෙත් මූලික වශයෙන් කොටස් දෙකකට බෙදේ. එනම්,

1. ආමිසය මුල්කරගත් වත් පිළිවෙත්
2. ප්‍රතිපත්තිය මුල්කරගත් වත් පිළිවෙත්, වශයෙනි.

නිර්මාණවාදී දේව සංකල්පය පිළිගන්නා ආගමික පද්ධති තුළ බහුල වශයෙන් දක්නට ලැබෙන්නේ ආමිසය මුල්කරගත් වත් පිළිවෙත්ය. ඒ අතර වැඳුම් පිදුම් කේන්ද්‍ර කරගත් චාරිත්‍ර විධි ප්‍රධානත්වයක් ගනී. ඒවාට මුල් තැනක් ලැබෙන්නේ එහි පිළිගත් දෙවියන් හෝ නිර්මාතෘවරයා සියල්ල විනිශ්චය කරන්නා වන නිසාය. සාමාන්‍ය ලෞකික ජීවිතයේ සැප සම්පත් පමණක්

නොව අවසාන පරමාර්ථය වන විමුක්ති ප්‍රතිලාභය පවා ප්‍රදානය කරන්නේ, දෙවියන් විසින් වීම මෙම ආමිෂයට මුල්තැන දීමේ හේතුවයි.

එහෙත් මෙම නිර්මාණවාදී සංකල්පය බැහැර කරන බෞද්ධ, ජෛන වැනි ආගමික සන්දර්භයන්හි ආමිසයට වඩා ප්‍රතිපත්තිය ගරු කරයි. එයට හේතුව විමුක්තිය අන්ත කොට ඇති ලෞකික, ලෝකෝත්තර සියලු ප්‍රතිලාභයන් (සැප හෝ දුක්) ලඟා කර ගන්නේ තමන්ගේ චර්යාවෙහි ප්‍රතිඵල නිසා වීමයි.[20] බුදුදහමෙහි මෙය ඉතා පැහැදිලිව දක්වා තිබේ. තමන්ගේ විමුක්තිය තමන් මත රඳා පවත්නා දෙයක් බව එහි අවධාරණය කරයි.[21] බුදුදහමෙහි ආගමික අංශය නියෝජනය කෙරෙන වත් පිළිවෙත් රාශියක් තිබේ. ආර්ය අෂ්ටාංගික මාර්ගය (නිවන් මග) කේන්ද්‍ර කොට ගත් මෙම වත් පිළිවෙත් ඉහලෝක, පරලෝක වශයෙනුත් ලෞකික, ලෝකෝත්තර වශයෙනුත් පවත්නා අරමුණු සාක්ෂාත් කර ගැනීම ම ඉලක්ක කොට ක්‍රියාත්මක වේ.

ඉහතින් දැක්වූ පරිදි බුදුදහම තුළ වඩාත් උසස් කොට සහ අගය කොට සලකන්නේ, ප්‍රතිපත්තිමය වත් පිළිවෙත්ය. ආමිසය තුළින් බොහෝ දුරට සිදු වන්නේ, තාවකාලික වූ ලෞකික සැප ලඟාකර දීමයි. සදාකාලික වූ ලෝකෝත්තර සැප සාධනය කෙරෙන්නේ, ප්‍රතිපත්තිමය වත් පිළිවෙත් තුළිනි. මේ දෙඅංශය පටලවා නොගත යුතුය[22] මේ අනුව බුදුදහමේ තරම් විධිමත් වූ ආගමික වත් පිළිවෙත් සම්ප්‍රදායයක් වෙනත් ආගමික සන්දර්භයක් තුළ දක්නට නැත. සමාජීය වශයෙන් උසස් සදාචාර සම්පන්න සමාජයක් බිහිකිරීමත් පෞද්ගලික වශයෙන් සදාචාර පාරප්‍රාප්තියට පත් සාමාජිකයකු බිහිකිරීමත් වත් පිළිවත් තුළින් අපේක්ෂිත ඒකායන අරමුණයි.

ආගමක විද්‍යමාන විය යුතු සිව්වන හා අවසාන ලක්ෂණය ලෙස එමිල් ඩුර්කයිම් පෙන්වා දෙන්නේ, ප්‍රධාන අරමුණු ඔස්සේ ගොඩනැගුණු වත් පිළිවෙත් ක්‍රියාත්මක කිරීම සඳහා යෝග්‍ය සහ



කැපවී ක්‍රියා කරන සංවිධානයක් තිබීමයි. ආගමක් සජීවී වීමට නම් එහි පැවතිය යුතු ප්‍රධාන අංගය වන්නේ, සංවිධාන යයි. සංවිධානය ශක්තිමත් නොවේ නම් අරමුණු ක්‍රියාත්මක කළ නොහැකිය. බුදුන් වහන්සේ තරම් ශක්තිමත් ලෙස ආගමික සංවිධානයක් ගොඩනැගූ වෙනත් කිසිදු ශාස්තෘවරයකු ආගමික ඉතිහාසයෙහි අපට හමු නොවේ. බුදුන් වහන්සේ විසින් ගොඩනැගූ එම සංවිධානය සංඝ සංවිධාන යයි. සංඝ සංවිධානය ප්‍රධාන කොටස් දෙකකින් සමන්විත වේ. එනම් භික්ෂු සහ භික්ෂුණී වශයෙනි. (පිරිසිදු ථෙරවාද සම්ප්‍රදායට අනුව භික්ෂුණී ශාසනය වර්තමානයේ අවිද්‍යමානය) ලෝකයේ වසර දෙදහස් පන්සිය ගණනක් අඛණ්ඩව පවත්නා එකම සංවිධානය මෙම සංඝ සංවිධාන යයි. මෙහි ඇති සුවිශේෂිත ම ලක්ෂණය වන්නේ පාලකයකු නොමැතිව පාලනය වීමයි. එනම් ස්වයං පාලනයක් තිබීමය.

බුදුන් වහන්සේ විසින් සංඝ සංවිධානය ඇති කර වසර විස්සකට පමණ පසු සංඝ සංවිධානයේ චිර පැවැත්ම උදෙසා පනවන ලද නීති රීති (විනය ශික්ෂා පද) මෙම ස්වයං විනයේ මූලධර්මයි. සංඝ සංවිධානයේ කාර්යභාරය, වගකීම, පැවැත්ම, පරිපාලනය, එයට ඇතුලත්වීම යම් යම් තනතුරු ප්‍රධානය ආදී සියලු දේ සිදුවිය යුතු ආකාරය පිළිබඳ, පූර්ණ ප්‍රජාතාන්ත්‍රික රාමුවක් මත ගොඩනැගී ඇති මෙම විනය නීති රීති මගින් පෙන්වා දී තිබේ. බුද්ධ දේශනාවන්ගෙන් තුනෙන් එකක් ම (විනය පිටකය) වෙන්වී තිබෙන්නේ සංඝ සංවිධානයේ යහ පැවැත්මට අදාළ නීති රීති පැහැදිලි කිරීම සඳහාය. බෞද්ධ සංඝ සංවිධානය පිළිබඳව ඉතාපුළුල්ව සාකච්ඡා කළ හැකි මුත් සංක්ෂිප්තව මෙම කරුණු සඳහන් කරන ලද්දේ, අනවශ්‍ය ලෙස මෙම ලේඛනය දීර්ඝවීම වළකා ගනු පිණිසය.

ආගමක මූලික වශයෙන් තිබිය යුතු යැයි එමිල් ඩුර්කයිම් ඉදිරිපත් කළ කරුණු ඉහත සාකච්ඡා කළ පරිදි නොඅඩුව

බුදුදහම තුළ අන්තර්ගතව තිබීම නිසා ම පමණක් නොව විමුක්ති සාධනය වැනි ලෝකෝත්තර අරමුණු ද සාක්ෂාත් කරණයට ඍජුව ම මග පෙන්වන නිසා පරිපූර්ණ ආගමික ලක්ෂණයන්ගෙන් බුදු දහම සමන්විතය.

එමනිසා බුදුදහම ආගමක් ලෙස සැලකීමෙහි කිසිදු වරදක් නැත. මහාචාර්ය වල්පොල රාහුල හිමියන් සඳහන් කරන්නේ 'බුද්ධ ධර්මය ආගමක් ද නැතහොත් දර්ශනයක් ද යනු නිතර අසනු ලබන ප්‍රශ්නයකි. මෙයින් කවර නමක් යෙදුව ද කමක් නැත. කවර නමකින් හඳුන්වනු ලැබුව ද බුද්ධ ධර්මය නම් බුද්ධධර්මය ම ය. නමෙහි ඇති වැදගත් කමක් නැත. බුදුන් වහන්සේගේ ධර්මයට අප දෙන බුද්ධාගම යන නම පවා සැලකිය යුත්තක් නොවේ'[23] යනුවෙනි. රෝගය සුව වේ නම් බෙහෙත කුමන නමෙන් හැඳින් වුවත් වරදක් නැත. එසේ ම ලෝකයේ ඇති තතු නිවැරදිව පහදන බුදුදහම අනුගමනයෙන් නිසි ඵල ලැබේ නම් එය කිනම් නමකින් හඳුන්වනු ලැබුව ද විශේෂ දෙයක් සිදු නොවන බව මෙයින් පෙනී යයි.

## නිගමනය

නිර්මාණවාදී දේව සංකල්පය මත පදනම් වන ආගමික සංකල්ප සහ නිර්මාණවාදය ප්‍රතික්ෂේප කරන ආගමික සංකල්ප යන සමස්ත ආගමික පද්දතියේ මූලිකම අරමුණ වන්නේ, පුද්ගලයාගේ මෙලොව සහ පරලොව ජීවිතය සුඛිත මුදිත කිරීම සඳහා මග පෙන්වීමයි. එය සිදු කෙරෙන්නේ දෙන ලද ආගමේ මූලික ඉගැන්වීම්වලට සාපේක්ෂකවය. වෙනත් ආකාරයකට සඳහන් කරන්නේ නම් ඕනෑම ශිෂ්ඨ සම්පන්න ආගමක් ම උත්සාහ ගන්නේ අදාළ ආගමික සන්දර්භය තුළ සදාචාර සම්පන්න සමාජයක් ගොඩනැගීමටය. මෙම අරමුණ සාක්ෂාත් කරණය සඳහා දෙන ලද ආගමේ එන සියලු ඉගැන්වීම් උපයුක්ත කෙරේ.



ඒ අනුව බුදු දහම ආගමක් වශයෙන් යථෝක්ත අරමුණ සාක්ෂාත් කරණය සඳහා උපරිමයෙන් ක්‍රියා කරන බව එහි එන ඉගැන්වීම් විමසීමේදී පැහැදිලි වේ. බුදු දහමේ උගන්වන පංචශීල ප්‍රතිපත්තිය පමණක් වුව විමසීමට ලක් කළ හොත් එමගින් මොනතරම් උසස් සුරක්ෂිත වූ සදාචාර සම්පන්න සමාජයක් ගොඩනැගීමට හැකිදැයි පැහැදිලිව පෙනී යයි. ඉහතින් අප සාකච්ඡා කළ ආගමක මූලික ලක්ෂණ හඳුනා ගැනීම සඳහා විවිධ විද්වතුන් විසින් ඉදිරිපත් කළ මතවාද මෙන්ම බුදු දහමේ උගන්වන සාමාන්‍ය ඉගැන්වීම් සහ ප්‍රධාන මූල ධර්ම යන සියල්ල තුළින් ම බුදු දහම ආගමික සංකල්පයන්ගෙන් මොනතරම් පොහොසත් අග්‍රගන්‍ය ආගමක්දැයි මනාව පැහැදිලි වේ.

## ආන්තික සටහන්

1. මූර්ති, ආගම සහ මියගිය ලෝකය, දෙවන මුද්‍රණය, මයුරෝ පොත් ප්‍රකාශකයෝ, 2009, 17 පිට.

2. i. සෝරත හිමි, වැලිවිටියේ ශ්‍රී සුමංගල ශබ්දකෝෂය, ප්‍රථම භාගය, ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ, 1999, 123 පිට.

   ii. ලියනගේ, සිරි, නිරුක්ති සහිත සිංහල ශබ්දකෝෂය, ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ, 2003, 145 පිට.

   iii. ගුණසේන මහා සිංහල ශබ්දකෝෂය, විජේතුංග හරිශ්චන්ද්‍ර ප්‍රථම මුද්‍රණය, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම කොළඹ, 2011, 211 පිට.

3. i. ගම්ලත්, සුචරිත, ඉංග්‍රීසි-සිංහල මහා ශබ්දකෝෂය, දෙවෙනි වෙළුම, 2009, 1669 පිට.

   ii. The belief in the existence of a god or gods, and the activities that are connected with the worhip of them. One of the systems of faith that are based on the belief in the existence of a god or gods, Oxford Advanced Learner's Dictionary, p 1075

4. i. ආගම සහ මියගිය ලෝකය, මූර්ති, ඉහත, 17 පිට.

   ii. අමරසේකර දයා, ආගම සහ සමාජය, 'ඉඳුවර' පර්යේෂණාත්මක ලේඛන සංග්‍රහය, සමාජ විද්‍යා 2, සංස්. දයා අමරසේකර, සහ රෝහිත දසනායක, 2004, 77 පිට.

5. මූර්ති, ආගම සහ මියගිය ලෝකය, ඉහත, 17 පිට.

6. සිංහල විශ්වකෝෂය, දෙවන කාණ්ඩය, 419 පිට.

7. 'Religion is a unifield system of belief and practices related to sacred things, uniting into a single moral community ail those who adhere to those beliefs and practices' අමරසේකර, දයා, ශ්‍රී ලංකා සමාජය, සමාජ විද්‍යාත්මක විමසුමක්, ආරිය ප්‍රකාශකයෝ, 1996, 96 පිට.

8. ඉහත එම, 97 පිට

9. අමරසේකර දයා, ශ්‍රී ලංකා සමාජය, සමාජ විද්‍යාත්මක විමසුමක්, ආරිය ප්‍රකාශකයෝ, 1996, 96 පිට.

10. අමරසේකර දයා, ආගම සහ සමාජය, 'ඉඳුවර' පර්යේෂණාත්මක ලේඛන සංග්‍රහය,සමාජ විද්‍යා 2, ඉහත, 77 පිට.



11. සෝරත හිමි අලුත්වැව, මානසික සික්ෂණය උදෙසා බෞද්ධ භාවනාව සහ වෙනත් ලිපි, සරසවි ප්‍රකාශකයෝ, 2011, 72 පිට.

12. පඤ්ඤාකිත්ති හිමි කොටහේනේ, ආගම සහ සමාජය, 2000, 05 පිට.

13. අමරසේකර දයා, ශ්‍රී ලංකා සමාජය, සමාජ විද්‍යාත්මක විමසුමක්, ඉහත, 95 පිට.

14. විමලධම්ම හිමි කන්දේගොඩ, ආගමේ දර්ශනය පිළිබඳ අධ්‍යයනයක්, දර්ශන අධ්‍යයන, දර්ශනපති හෝමාගම ධම්මානන්ද නාහිමි අභිනන්දන ශාස්ත්‍රීය කලාපය, ස්ංස.මැදගම්පිටියේ විජිතධම්ම හිමි ආදී. 2011, 429 පිට.

15. සෙය්‍යථාපි බ්‍රාහ්මණ උප්පලං වා පදුමං වා පුණ්ඩරීකං වා උදකේ ජාතං උදකේ සංවඩ්ඪං උදකං අච්චුග්ගම්ම ඨාති අනුපලිත්තං උදකේන. එවමේව ඛෝ අහං බ්‍රාහ්මණ ලෝකේ ජාතෝ ලෝකේ සංවඩ්ඪෝ ලෝකං අභිභුය්‍ය විහරාමි අනුපලිත්තෝ ලෝකේන බුද්ධෝති මං බ්‍රාහ්මණ ධාරේහිති. අ.නි.2 බු.ජ.ත්‍රි. 78 පිට

16. ආගම හෝ පුද්ගලයකු හෝ කෙරෙහි තිබෙන අධික විශ්වාසය, ඇදහීම, ශ්‍රද්ධාව, සම්බන්ධය, ස්නේහය, ඇල්ම, ගුණසේන මහා සිංහල ශබ්දකෝෂය, විජයතුංග හරිශචන්ද්‍ර, 1281 පිට.

17. බැතිය, සැදැහැසිත, ඇදහීම, විශ්වාසය, භක්තිය, උනන්දුව, ප්‍රේමය, ඉහත, 1706 පිට.

18. ධර්මසිරි ගුණපාල, බෞද්ධ සදාචාරයේ මූලධර්ම, ඉහත, 03 පිට.

19. අස්සද්ධෝ අකතඤ්ඤූච සන්ධිච්ඡේදෝච යෝ නරෝ හතාවකාසෝ වන්තාසෝ සවේ උත්තම පෝරිසෝ- බු.නි. 1, අරහන්ත වර්ගය ධම්මපදපාලිය, 46 පිට.

20. කම්මස්සකා මාණව සත්තා කම්මදායාදා කම්මයෝනි කම්මබන්ධූ කම්මපටිසරණා. කම්මං සත්තේ විභජති යදිදං හීනප්පනීතතායාති, ම.නි. 3. චූල්ලකම්මවිභංග සූත්‍රය, බු.ජ.ත්‍රි. 432 පිට.

21. අත්තදීපා භික්ඛවේ විහරථ අත්ත සරණා අනඤ්ඤ සරණා

22. අඤ්ඤාහිලාභූපනිසා අඤ්ඤානිබ්බානගාමිනි
ඒවමේතං අභිඤ්ඤාය භික්ඛු බුද්ධස්ස සාවකෝ
සක්කාරං නාභිනන්දෙය්‍ය විවේකමනුබ්‍රෑහයේ. බු.නි. 1, බාල වර්ගය ධම්මපදපාලිය, 40 පිට.

23. රාහුල හිමි වල්පොල, බුදුන් වදාළ ධර්මය, 08 පිට.